සොබාදහම සුරකිමු
LET'S PROTECT NATURE

YOUNG ZOOLOGISTS' ASSOCIATION
SRI LANKA
ESTD 1972

ලෝක
මන්ද වලසුන්ගේ දිනය



සොබාදහම සුරකිමු
LET'S PROTECT NATURE

YOUNG ZOOLOGISTS' ASSOCIATION
SRI LANKA
ESTD 1972

ප්‍රකාශනය :
ප්‍රකාශන කමිටුව,
ශ්‍රී ලංකා තරුණ සත්ත්වවේදීන්ගේ සංගමය

සම්බන්ධීකරණය :
දිලූෂ ලක්ෂාන්
තරින්දි සංජනා
සියපත් කිතුල්ගොඩගේ

නිර්මාණය :
දිලූෂ ලක්ෂාන්

අන්තර්ගතය :
චේතිය සහන් ලියනගේ

පරිවර්තනය :
දෙව්මි සත්‍යංගනා

ඡායාරූප :
මිනෙත් විස්මිත
මිතුන් සේනානායක

ලෝක මන්ද වලසුන්ගේ දිනය

සෑම වසරකම ඔක්තෝම්බර් මස 12 වන දින ලෝක මන්ද වලසුන්ගේ දිනය සැමරෙන අතර එමගින් වර්තමානයේ අවදානමට ලක් වී ඇති සත්ත්ව කාණ්ඩයක් ලෙස නම් කර ඇති ඉන්දියානු උපමහද්වීපයේ පමණක් හමුවන මන්ද වලසුන් පිළිබඳ ලෝක ප්‍රජාව දැනුවත් කිරීම හා ඔවුන්ගේ සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙන් කර ඇත. Wildlife SOS නැමැති ඉන්දියානු ස්වේච්ඡා සංවිධානයේ යෝජනාවක් මත ලෝක සංරක්ෂණ සංගමය (IUCN) මගින් මෙම දිනය ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව 2022 වර්ෂයේ ප්‍රථම සැමරුම පැවැත්විය.

කෘෂිකර්මාන්තය හා දැව සඳහා වනාන්තර එළි කිරීම මත වාසස්ථාන අහිමිවීමෙන් මෙන්ම දඩයම් කිරීම හා නීති විරෝධී සුරතල් සත්ත්ව වෙළඳාමේ ගොදුරක් වීම මත මෙම විශේෂයේ ගහණායනය පහළ යෑම හේතුවෙන් ලෝක රතු දත්ත ලැයිස්තුවෙහි "අවදානමට ලක් වී ඇති" (Vulnerable) සත්ත්ව කාණ්ඩයක් ලෙසද මන්ද වලසා නම් කර ඇත. නමුත් බීජ විසුරුවා හැරීමෙන් හා කෑමී ගහණා පාලනය කිරීම මගින් මෙම අපූරු සත්ත්ව විශේෂය තමා ජීවත් වන පරිසර පද්ධතිය තුළ වැදගත් කාර්යභාරයක් සිදු කරනු ලබයි.



මෙම දිනයේ වැදගත්කම සැකෙවින් මෙසේය;

දැනුවත්භවය ඉහළ නැංවීම

මොවුන් මුහුණ දෙන අභියෝග හා ඒවයින් ඔවුන් ආරක්ෂා කර ගැනීමට අදාළ තොරතුරු සමාජගත කිරීම.

පරිසර සංරක්ෂණය ප්‍රවර්ධනය

මන්ද වලසුන් සංරක්ෂණය කිරීමෙහිලා වැදගත් කාර්යභාරයක් ඉටු කරන Wildlife SOS වැනි සංවිධානවලට සහය දැක්වීම දිරිමත් කිරීම.

අධ්‍යාපනය ලබා දීම

මොවුන්ගේ හැසිරීම් රටා,ජීවත් වන පරිසර පද්ධති හා සම්බන්ධ විද්‍යාත්මක අවබෝධය වැඩිදියුණු කිරීම.





මෙම දිනයේ ඔබේ කාර්යභාරය මෙසේය;

මෙම පණිවුඩය සමාජය තුළ පැතිරවීම - මන්ද වලසුන් ගැන හා ඔවුන්ගේ සංරක්ෂණ උත්සහයන් පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීම.

සරක්ෂණය උදෙසා වූ සංවිධාන වලට සහය දීම - මෙම සංවිධාන වලට මූල්‍ය හෝ ශ්‍රම දායකත්වය ලබා දීම හෝ ඒ සඳහා අන් අය දිරිමත් කිරීම.

මන්ද වලසුන් ජීවත් වන සත්ත්වෝද්‍යාන නැරඹීමට යාම - මෙදිනට මොවුන් පිළිබඳ එම සත්ත්වෝද්‍යානවල පැවැත්වෙන විවිධ විශේෂාංග හා අධ්‍යාපනික වැඩසටහන්වලට සහභාගී වීම.

ලොව ජීවත් වන මන්ද වලසුන් ඔවුන්ගේ ව්‍යාප්තිය හා භෞතික ලක්ෂණ පදනම් කරගනිමින් උප විශේෂ 2ක් යටතේ වර්ග කර ඇත.

ඉන්දියානු මන්ද වලසා *(Melursus ursinus ursinus)*

ව්‍යාප්තිය - ඉන්දියානු අර්ධද්වීපය තුළ (ඉන්දියාව, නේපාලය, භූතානය) ඉන්දියානු අර්ධද්වීපයට අයත් බංග්ලාදේශයේ මෙම විශේෂය මේ වන විට වඳ වී ඇතැයි විශ්වාස කෙරේ.

භාහිර ස්වරූපය - ශරීර ප්‍රමාණයෙන් විශාලතම උප විශේෂය වේ.

වාසස්ථාන - තෙත් හා වියළි කලාපීය නිවර්තන වනාන්තර, සවානා, ලඳු කැලෑ, තණ බිම්

ශ්‍රී ලංකා මන්ද වලසා *(Melursus ursinus inornatus)*

ව්‍යාප්තිය - ශ්‍රී ලංකාවට අවේණිකයි.

භාහිර ස්වරූපය - ශරීර ප්‍රමාණයෙන් ඉන්දියානු උප විශේෂයට සාපේක්ෂව කුඩා වන අතර සාපේක්ෂව කෙටි හා අඩම ලෝම වැස්මක් දරයි.

වාසස්ථාන - වියළි කලාපීය නිවර්තන වනාන්තර, සවානා, ලඳු කැලෑ, තෘණ බිම්



ඉන්දියානු මන්ද වලසා

ලොව සිටින කුඩාම වලසුන්ගෙන් කෙනෙක් වන අතර ශරීර ප්‍රමාණයෙන් “Sun Bear” නැමැති වලස් විශේෂයට සමාන වේ.

දිගු ලොම් පිරුණු ස්භාවයක් දරන අතර ලෝම වැස්ම කළු වර්ණයක් සහිත වුවද ඇතැම් විට යන්තමින් රතු හෝ දුඹුරු පැහැයට හුරු අවස්ථාද ඇත. පපු ප්‍රදේශයේ ක්‍රීම් පැහැති “V/Y” හැඩැති සලකුණක් දැකිය හැකිය.

කැලෑ බද ප්‍රදේශවලින් හමු වේ.

වාසස්ථාන විවිධාකාර වුවද, විශාල ශාක ආශ්‍රිතව ගැවසීමට ප්‍රිය කරයි.



ශ්‍රී ලංකා මන්ද වලසා

සාමාන්‍යයෙන් ශාරීරිකව කුඩා වේ. "දූපත් වලට සීමා වූ විශාල සතුන් පරිණාමයත් සමග ශරීර ප්‍රමාණයෙන් කුඩා වේ" යන සිද්ධාන්තයට අනුකූල වේ.

මෙම විශේෂයේ පිරිමි සතුන් ඔවුන්ගේ අනෙක් උපවිශේෂයේ සතුන්ට සපේක්ෂව කෙටි ලෝම දරන අතර ලෝම ඝනත්වයද සාපේක්ෂව අඩුය.

උතුරු හා නැගෙනහිර ප්‍රදේශයේ පහතරට වියළි කලාපයට සීමා වී ඇත.

වාසස්ථාන පරාසය සාපේක්ෂව කුඩාය.





1700 පමණ කාල වකවානුවේ දී මන්ද වලසුන් අයත් වේ යැයි විශ්වාස කළේ "Sloth" නැමැති සත්ත්වයින් අයත් වන කුලයට වන අතර එකල මොවුන් හඳුන්වා ඇත්තේ "Bear Sloth" යන නමිනි. ඉන් පසු මෙම වරද නිවැරදි කරනු ලැබුවේ 1810 දී පමණ ඉන්දියාවෙන් එකතු කරන ලද මන්ද වලසාගේ ප්‍රථම නිදර්ශකය යුරෝපයට යැවීමෙන් පසුව වන අතර එතැන් සිට මොවුන් "Sloth Bear" යන නාමයෙන් හැඳින්විය.

මෙම සත්ත්ව කාණ්ඩය සාමාන්‍යයෙන් මිනිස් ක්‍රියාකාරකම් අවම ආරක්ෂිත ප්‍රදේශවල දහවල් කාලයේ සැරිසරන අතර බොහෝ විට මිනිස් වාසස්ථාන ආශ්‍රිත බණ්ඩනයට ලක් වූ වනාන්තර ප්‍රදේශවල රාත්‍රී කාලයේ හැසිරීමට වැඩි නැඹුරුතාවක් දක්වයි. මොවුන් මදක් ලජ්ජාශීලි සත්ත්ව කාණ්ඩයක් වන අතර බොහෝ විට හුදෙකලාව සිටීමට ප්‍රිය කරයි. සුවැඳි සමයේදී යුගල් වශයෙන්ද දැකගත හැකි අතර ඇතැම් අවස්ථාවලදී කුඩා කණ්ඩායම් ලෙස (එක් ගැහැණු සතෙක් හා පිරිමි සතුන් කිහිපදෙනෙක්, මව් සත්ත්වයා හා පැටවුන්) ද හැසිරෙනු දැක ගත හැකිය.

මොවුන් අනතුරකදී ආරක්ෂා වීම සඳහා සතුරා බිය ගැන්වීමට පිටුපස පාද යුගලයෙන් සිට ගනිමින් ශරීරයේ විශාලත්වය පෙන්නුම් කරන අතර තියුණු හා ශක්තිමත් නිය පෙළ විදහා පාමින් පහර දීමටද සැරසේ. මොවුන් ඉතා කලහාකාරී සත්ත්ව කාණ්ඩයක් ලෙස හැඳින්වෙන අතර ශරීර ප්‍රමානයෙන් හා ශක්තිමත් බවින් කොටියන් පවා අභිබවා යන අතරම කොටින්ගේ පහරදීම් හමුවේ බොහෝ විට ඒවා වළක්වා ගැනීමටද සමත් වේ. මව් සතුන් තම පැටවුන්ගේ ආරක්ෂාව සඳහා ඔවුන්ද රුගෙන ගස් මතට නගින අවස්ථාද නිරීක්ෂණය කර ඇත.

"පලු" හා "වීර" නැමැති ශාකවල ඵල දරන ආහාර සුලබ කාල වලදී වැඩි වශයෙන් මොවුන් නිරීක්ශනය කිරීමේ හැකියාව ඇත. තම පැටවුන් පිට මත රුගෙන යන වලස් පවුලේ ජීවත් වන එකම විශේෂයද මන්ද වලසා වේ. මොවුන්ට දිගු කලක් ජලය නොමැතිව සිටීමට අපහසු වන අතර සෑම රාත්‍රියකම පිපාසය නිවා ගැනීම සිදු කරයි. මොවුන් තම විශේෂයේ අනෙකුත් සතුන් සමඟ සන්නිවේදනය කිරීම සඳහා විවිධාකාර මුහුණු ඉරියව් මෙන්ම විවිකත නාද රටාද භාවිත කරනු ලබයි. මොවුන් සර්වභක්ෂක සත්ත්ව විශේෂයක් වන අතර ශ්‍රී ලංකා මන්ද වලසාගේ ආහාර රටාව තුළද ශාක හා සත්ත්ව කොටස් යන දෙවර්ගයම අන්තර්ගත වේ. මොවුන්ගේ ආහාර රුචිය ඍතුමය වශයෙන් හා ආහාර සුලභතාවය මත වෙනස් වේ. මොවුන්ගේ ආහාර රටාව තුළ පලතුරු, කුඹින්, වේයන්, හා මී පැණි ප්‍රධාන තැනක් ගන්නා අතර ඔවුන්ගේ තියුණු නිය මඟින් මී වද කඩා ඒ තුළ ඇති මී පැණි හා මී මැසි කීටයන් ආහාරයට ගනී. මෙය ඔවුන්ගේ ආහාර සොයා ගැනීමේ සුවිශේෂී අනුවර්තනයක් වේ.



ශ්‍රී ලංකා මන්ද වලසා නැරඹීමට සුදුසු ස්ථාන ලෙස,

විල්පත්තු ජාතික වනෝද්‍යානය
යාල ජාතික වනෝද්‍යානය
වස්ගමුව ජාතික වනෝද්‍යානය
දැක්විය හැකිය.

තවද ඉන්දියානු මන්ද වලසා නැරඹීමට හැකි ස්ථාන ලෙස,

කර්නාටක ප්‍රදේශයේ "දරෝජි" මන්ද වලසුන් සඳහා වූ අභය භූමිය
මහාරාෂ්ට ප්‍රදේශයේ "ටඩොබා - අන්ධාරී" ව්‍යාඝ්‍ර රක්ෂිතය
මධ්‍ය ප්‍රදේශ්හි "සත්පුර" ව්‍යාඝ්‍ර රක්ෂිතය
මධ්‍ය ප්‍රදේශ්හි "කන්හා" ජාතික වනෝද්‍යානය
දැක්විය හැකිය.



ඕනෑම සත්ත්ව විශේෂයක් රැක ගැනීම සඳහා ඔවුන්ගේ හැසිරීම්, ජීවත් වන පරිසරය, හා වාසස්ථාන සම්බන්ධව ඇති විද්‍යාත්මක දැනුම අතිශය වැදගත් වේ. ලංකාවේ මන්ද වලසුන්ගේ සංරක්ෂණය වෙනුවෙන් කැපවී කටයුතු කරන ආචාර්ය ශාමලා රත්නායක විසින් මන්ද වලසුන් පිළිබඳ මෙරට තුළ සිදු කරනු ලැබූ ප්‍රමුඛතම ක්ෂේත්‍ර අධ්‍යනය 2003 වර්ෂයේ ආරම්භ කරන ලදී. මෙමගින් එම සතුන්ට රේඩියෝ කරපටි පලඳවා ඒ හරහා ඔවුන්ගේ වසම් පරාසය, හැසිරීම, හා ජීව විද්‍යාත්මක කරුණු අධ්‍යනය කල අතර එමගින් මොවුන්ගේ සංරක්ෂණ සැලසුම් මෙන්ම පරිසර පද්ධති, මිනිසුන් සමග ඔවුන්ගේ පැවැත්ම සම්බන්ධව වැදගත් කරුණු රැසක් සොයා ගත හැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස මේ සම්බන්ධව පොතක්ද ඇය අතින් ප්‍රකාශයට පත් වූ අතර එය මොවුන්ගේ සංරක්ෂණය පිළිබඳ අධ්‍යන කටයුතුවලට ඉමහත් පිටිවහලක් විය. ලංකාව තුළ මොවුන්ගේ ගහනය වැඩි කිරීම සඳහා පරිසර ආරක්ෂණ ප්‍රදේශ ඇති කිරීම හරහා මොවුන්ගේ වාසස්ථාන ආරක්ෂා කිරීම, මොවුන් සම්බන්ධ පර්යේෂණ කටයුතු, ගහන අධීක්ෂණය හා ප්‍රජා දැනුවත් කිරීම් වැනි සංරක්ෂණ පියවර ගෙන ඇති අතර මෙය මිනිසුන් හා වලසුන් අතර ගැටුම් අවම කිරීමටද හේතු වී ඇත.

ශ්‍රී ලංකාවේ බොහෝමයක් වනෝද්‍යාන තුළ සිදු කර ඇති ක්ෂේත්‍ර අධ්‍යන කටයුතු හරහා ආචාර්ය ශාම්ලා රත්නායක සිදු කළ සොයා ගැනීම් හා ඒවායින් ප්‍රකාශයට පත් කළ විද්‍යාත්මක පත්‍රිකා මඟින් මෙම සුවිශේෂී සත්ත්ව කාණ්ඩය පිළිබඳ ඇය සතු අසමසම දැනුම විදහාපායි. Sloth Bear; the barefoot bear of Sri Lanka නමින් ඇය ලියා පළ කරන ලද කෘතිය මන්ද වලසගේ සංරක්ෂණය සඳහා උනන්දුවක් දක්වන ඕනෑම අයෙකුට මහත් පිටුවහලක් වේ.

මන්ද වලසුන්ට ඇති තර්ජන,

වාසස්ථාන අහිමිවීම හා බණ්ඩනය


දඩයම් කිරීම හා අනවසර වනජීවීන් වෙළඳාම

මිනිසුන් හා වන සතුන් අතර ගැටුම්

විනෝදාශ්වාදය සඳහා යොදා ගැනීම

ආහාර නිඟතාවය







ජායාරූප අන්තර්ජාලයෙන්



සංරක්ෂණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග,

සංරක්ෂණය සඳහා වූ සංවිධානවලට සහය වීම.

පරිසර සංචාරක කර්මාන්තය දියුණු කිරී

අනීතික වෙළඳ කටයුතුවලට එරෙහි වීම.

ප්‍රජා දැනුවත් කිරීම් ප්‍රවර්ධනය කිරීම.


තිරසාර සංවර්ධනය ප්‍රවලිත කිරීම.

වගකීම් සහිතව හා අවබෝධයෙන් යුතුව පරිසරය සමග ගනුදෙනු කිරීම.

ගලවා ගැනීමේ හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවලට සහයෝගය දැක්වීම.

සොබාදහම සුරකිමු
LET'S PROTECT NATURE

YOUNG ZOOLOGISTS' ASSOCIATION
SRI LANKA
ESTD 1972



ශ්‍රී ලංකා තරුණ සත්ත්වවේදීන්ගේ සංගමය,
ජාතික සත්ත්වෝද්‍යානය,
අනගාරික ධර්මපාල මාවත,
දෙහිවල.

දුරකථනය - 011 4852 828
ඊමේල් ලිපිනය - srilankayza@gmail.com
වෙබ් අඩවිය - www.yzasrilankalk